මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa",104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web : www.cea.lk

| අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. | ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. | දිනය / திகதி / Date: 2020.07.06 |
|---|---|---|

## මාධ්‍ය නිවේදනය

**මධ්‍යම පරිසර අධිකාරිය, "දිරාපත් නොවන පොලිතින් ලංචිශීට්" වැටලීම් ජුලි මස සිට යළි අරඹයි .....**

කොවිඩ් 19 වසංගතය පැතිරයාම සමඟ රට තුළ පැවති වාතාවරණය හේතුවෙන්, තාවකාලිකව නැවැත්වීමට සිදු වූ "දිරාපත් නොවන පොලිතින් ලංචිශීට්" වැටලීම් නැවත ආරම්භ කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කර ඇත. ඒ අනුව "දිරාපත් නොවන පොලිතින් ලංචිශීට්" වැටලීම් සිදුකිරීම 2020 ජුලි මස සිට දිවයින පුරා ක්‍රියාත්මකය.

පසුගිය දින කිහිපය තුළ මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරන ලද අහඹු නිරීක්ෂණ අනුව "දිරාපත් නොවන පොලිතින් ලංචිශීට්" පොදු සමාජය තුළ භාවිතවන බවක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව, වැටලීම් නැවත අරම්භ කිරීම කඩිනම් කිරීමට තීරණය කෙරිණ.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය හා සබැඳිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2034/34 (2017 සැප්තැම්බර් 01) අති විශේෂ ගැසට් පත්‍රය මගින් පොලිතින් සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු අනුව මෙම වැටලීම්වලදී කටයුතු කරනු ඇත. ඒ අනුව පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

1. (I) දේශීය භාවිතය සඳහා පොලිතින් අමුද්‍රව්‍යයක්වන ආහාර දවටන නිපදවීමඃ සහ

   (II) පොලිතින් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත ආහාර දවටන රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කර ඇත.

කොවිඩ් 19 වසංගතය පැතිරයාම සමඟ ලොවපුරා ජනයාගේ දෛනික ක්‍රියාකාරීත්වය අවම වීම හේතුවෙන් පරිසර දූෂණය අඩුවෙමින් පරිසරය සුවපත්වීම ආරම්භ වී ඇති අවස්ථාවක, පරිසර දූෂණය සිදුවන කිසිදු ක්‍රියාවක් සිදුනොකර වගකීමෙන් යුතුව කටයුතු කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස වැඩිදුරටත් ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0716566660, 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය